# දැන්වීමයි

## ශ්‍රම මිලදී ගැනීමේ පදනමින් දිවා සුරැකුම් මධ්‍යස්ථාන කළමනාකරු තනතුර සහ සහකාර මධ්‍යස්ථාන කළමනාකරු තනතුර සඳහා බඳවා ගැනීම

## දොම්පෙ ප්‍රාදේශීය සභාව

දොම්පෙ ප්‍රාදේශීය සභාව මගින් අලුතින් ආරම්භ කිරීමට නියමිත කිරිදිවැල දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන කළමනාකරු තනතුර සහ සහකාර මධ්‍යස්ථාන කළමනාකරු තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

### මධ්‍යස්ථාන කළමනාකරු

**අධ්‍යාපන සුදුසුකම්** :- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

**වෘත්තීය සුදුසුකම්** :-

i. ළමා රැකවරණ සැලසීමෙහි ජාතික වෘත්තීය සුදුසුකම් 6 වැනි මට්ටම ලබා තිබිය යුතුය.
ii. ළමුන් සම්බන්ධයෙන් කටයුතු කර අවම වශයෙන් වසර 5 ක පළපුරුද්දක් තිබිය යුතුය. සහකාර මධ්‍යස්ථාන කළමනාකරුවෙකුව වශයෙන් සේවය කර ඇති අයට ප්‍රමුඛත්වය ලබා දේ.
iii. අවම වශයෙන් වයස අවුරුදු 30 ට නො අඩු විය යුතුය.

### සහකාර මධ්‍යස්ථාන කළමනාකරු

**අධ්‍යාපන සුදුසුකම්** :- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

**වෘත්තීය සුදුසුකම්** :-

i. ළමා රැකවරණ සැලසීමෙහි ජාතික වෘත්තීය සුදුසුකම් 5 වැනි මට්ටම ලබා තිබිය යුතුය.
ii. ළමුන් සම්බන්ධයෙන් කටයුතු කර අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුය. ළමා රැකවරණ සහායකයෙකු වශයෙන් සේවය කර ඇති අයට ප්‍රමුඛත්වය ලබා දේ.
iii. අවම වශයෙන් වයස අවුරුදු 30 ට නො අඩු විය යුතුය.

**පොදු**

**වෙනත් සුදුසුකම්** :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

**කොන්දේසි** :-

i. මෙය දෛනික පදනමින් බඳවාගනු ලැබීමක් වන අතර, ඉදිරියේ දී ස්ථිර පදනමින් බඳවාගැනීමට හේතුවක් නොවනු ඇත.
ii. සේවා අවශ්‍යතාව මත සේවයේ යෙදවීමක් වන බැවින් කලින් දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ හැකියාව දොම්පෙ ප්‍රාදේශීය සභා ලේකම් සතුය.
iii. සේවය කරන මාසය සඳහා වැටුප ඊළඟ මස 10 වන දිනට ගෙවීම් කරනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය** :- මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් සිදුකරනු ලබන අතර, ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය** :-

1) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පතක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "දිවා සුරැකුම් මධ්‍යස්ථාන කළමනාකරු තනතුර සඳහා බඳවාගැනීම" ලෙස සඳහන් කර 2025.02.15 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, දොම්පෙ ප්‍රාදේශීය සභාව, කිරිඳිවැල. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.
3) තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිවීමෙන් ආපසු හරවා යැවුනු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4) අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට එම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.
   a. උප්පැන්න සහතිකය
   b. අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික
   c. වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික
   d. පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය
   e. ජාතික හැඳුනුම්පත

ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී
දොම්පෙ ප්‍රාදේශීය සභාව.
2025.01.28

## දොම්පෙ ප්‍රාදේශීය සභාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන කළමනාකරුවන්/ සහකාර මධ්‍යස්ථාන කළමනාකරුවන් බඳවාගැනීමට මිල ගණන් ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රයයි.

1. අයදුම් කරන තනතුර :- ..........................................................................................
2. සම්පූර්ණ නම :- ..........................................................................................
3. ලිපිනය :- ..........................................................................................
4. දුරකථන අංකය :- ..........................................................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................................
6. ස්ත්‍රී/ පුරුෂභාවය :- ..........................................................................................
7. උපන් දිනය :- අවු .................. මාස .....................දින ............................................
8. වයස (2025.01.01 දිනට) :- ..........................................................................................
9. ජාතිය :- ..........................................................................................
10. ආගම :- ..........................................................................................
11. විවාහක/අවිවාහක බව :- ..........................................................................................
12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණන්න.)

අ.පො.ස. (සා.පෙළ)

වර්ෂය :- .....................................

විභාග අංකය :- ................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |

අ.පො.ස. (උ.පෙළ)

වර්ෂය :- .....................................

විභාග අංකය :- ................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

13. වෘත්තීය සුදුසුකම් :-

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

14. අමතර සුදුසුකම් :-

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

15. ඉහත තොරතුරු සනාථ කිරීමට පහත ලිපි ලේඛනවල පිටපත් ඉදිරිපත් කර ඇති බව සනාථ කරමි.

15.1. උප්පැන්න සහතිකය

15.2. අධ්‍යාපන සහතික හා ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික

15.3. වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික

15.4. පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය

15.5. ජාතික හැඳුනුම්පත්‍රයේ ඡායා පිටපත

16. පැය 6ක දිනක් සඳහා අපේක්ෂා කරනු ලබන දීමනාව :- ........................................

17. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මා විසින් මෙහි සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

දිනය :- ................................ ..........................................

අයදුම්කරුගේ අත්සන